**ශ්‍රී ලංකාවේ නව රජයක් සඳහා ආදායම් උපායමාර්ග සාරාංශය - 2022 අප්‍රේල්**

**A. සංදර්භය**

1. මෙම ලිපිය සම්පාදනය කරනු ලබන අවස්ථාව වන විට, ශ්‍රී ලංකා රජය සිය ණය ගැන නැවත සාකච්ඡා කර ප්‍රතිව්‍යුහගත කරගන්නට සමත් වේද, නැතහොත්, අක්‍රමවත් ණය පැහැර හැරීමකට ලක්වනු ඇත්ද යන්න අපි නොදනිමු. මෙම සටහනේ ඇති අදහස් එකී ඕනෑම තත්වයකට අදාළ වනු ඇත..
2. හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා ආදායම් සොයාගැනීමට රජයට සිදුවේ. ඒ වෙනුවෙන් විශ්වසනීය මූලෝපායක් සම්පාදනය කිරීමට සිදුවේ. (අ) ඉහළ උද්ධමනය හමුවේ පවතින ආදායම ආරක්ෂා කර ගැනීම අවශ්‍යය. (ආ) අනාගතයේ දී ආදායම වැඩි කර ගැනීමට අවශ්‍යය. එහිදී, දෙවැනියට සඳහන් කරන ලද කරුණ අත්‍යවශ්‍ය වනු ඇත. ඒ පහත දැක්වෙන හේතු නිසාය. (අ) එකඟ වූ ණය ප්‍රතිව්‍යුහගත කිරීමකදී අවශ්‍ය කටයුතු සිදුකිරීමට සහ (ආ) අක්‍රමවත් ණය පැහැර හැරීමකින් පසුව නැවත විදේශ ණය ලබා ගැනීමට හැකියාව ලබාගැනීම සඳහා.
3. ඕනෑම මධ්‍ය කාලීන හෝ දිගුකාලීන ආදායම් උපාය මාර්ගයක් මගින් බදු පරිපාලනය සම්බන්ධ ගැටලු විසඳීමට අවශ්‍ය වනු ඇත. බදු පරිපාලනය වැඩිදියුණු කිරීමකින් තොරව, මධ්‍යම හා දිගු කාලීන වශයෙන් ආදායම් වැඩිකර ගැනීමට ඇත්තේ සීමිත අවස්ථාවකි.
4. බදු පරිපාලනය ප්‍රතිසංස්කරණය කිරීමේදී මූලික වශයෙන් අවධානය යොමුකළ කළ යුතු වන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) වෙතය. මේ සඳහා හේතු 4 ක් ඇත:
    - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩි අවස්ථාවක් තිබේ. එහි කාර්ය සාධනයේ අඩුපාඩු පිළිබඳ ගැටලු වඩාත් පහසුවෙන් විසඳාගත හැකිය.
    - එයට සාපේක්ෂව, රේගුව ප්‍රතිසංස්කරණවලට වැඩි විරෝධයක් දක්වනු ලැබිය හැකි අතර, දැනට තිබෙන තත්වය පවත්වාගැනීමට කටයුතු කිරීමේ වැඩි පෙළඹුමක් තිබේ.
    - ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකය තවදුරටත් පිරිහීමට ඉඩ තිබේ. ඒ සමගම, බරපතල ආනයන පාලනයන් ද දිගටම පවතින්නේ යයි උපකල්පනය කළහොත්, ආනයන මත බදු අනුපාත වැඩි කිරීමෙන් අමතර ආදායමක් උපයා ගත නොහැක. ('සුඛෝපභෝගී' ආනයනය සඳහා ඉතා ඉහළ තීරුබදු අය කිරීමට ඉඩ තිබේ. දේශපාලන හේතූන් මත එය යෝග්‍ය වේ. එහෙත්, එයින් විශාල ආදායමක් ලැබෙන්නේ නැත.)
    - දිගුකාලීනව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කරනු ලබන ඍජු බදු ප්‍රමාණය වැඩි වන පරිදි ශ්‍රී ලංකාව පරිවර්තනය විය යුතුය. විශේෂයෙන්ම, ආදායම් බදු වෙත යොමු විය යුතුය.

**B. ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව නිර්දේශ**

1. පළමු ප්‍රමුඛතාවය වනුයේ 2019 අයවැයෙන් ලබා දී ඇති බදු අඩු කිරීම් ආපසු හැරවීමයි. රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීම අවසන් කළ යුතුය. උපයන විට ගෙවීමේ බද්ද (PAYE) වෙනුවට අනිවාර්ය පුද්ගල ඉහළ ආදායම් බද්ද (APIT) හඳුන්වා දිය යුතුය.
2. පුද්ගල ආදායම් බදු (PIT) අනුපාතික ඒ සමගම වැඩි කළ යුතු අතර, පුද්ගලආදායම් බදු ගෙවීමේ සීමාව අඩු කළ යුතුය (උද්ධමන අනුපාතිකය සැලකිල්ලට ගත යුතුය. එමගින් ඵලදායී සීමාව අඩු වනු ඇත).
3. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කළමනාකාරිත්වය, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහ වෘත්තීය සමිති සමඟ වහා උපසේ විමසීමක් පැවැත්විය යුතුය. මාස කිහිපයක් ඇතුළත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි RAMIS තොරතුරු තාක්ෂණ පද්ධතියේ ගැටලු නිශ්චිතව හඳුනාගෙන ඒවා විසඳීම සඳහා කාර්ය සාධක බලකායක් නිර්මාණය කළ යුතුය. සම්පූර්ණයෙන්ම පැහැදිලි කළ නොහැකි කිසියම් ගැටලුකාරී හේතු නිසා එය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නැත.
4. නැවතත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කළමනාකාරිත්වය, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහ වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කර, දෙපාර්තමේන්තුවෙහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ගයක් සම්පාදනය කිරීම සඳහා තවත් කුඩා කාර්ය සාධක බලකායක් පත්කළ යුතුය. අවුරුදු හතරක කාල පරිච්ඡේදයක් තුළ අවම වශයෙන් 50% කින් ආදායම වැඩි කිරීමේ ඉලක්කයක් ලබාදිය යුතුය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ මෙය සිදු කිරීමට තරම් ප්‍රමාණවත් කැපවීමක් සහ හැකියාවක් ඇතැයි අපි විශ්වාස කරමු. නොමැති බව වඩාත්ම පැහැදිලිව පෙනෙන සාධකය වන්නේ මූලෝපායික නායකත්වයයි. එය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
5. ලංකාවේ බදු ක්‍රමය සම්පූර්ණයෙන්ම විවිධ ආකාරයේ බදු නිදහස් කිරීම්වලින් සමන්විතය. ඒවා අඩු කිරීම මගින් බදු ආදායම් වැඩිකිරීම සහ බදු කාර්යක්ෂමතාව වැඩිකිරීම යන දෙකටම සැලකිය යුතු

දායකත්වයක් ලබා දිය හැකිය. පවතින සියලුම බදු නිදහස් කිරීම් පරීක්ෂා කිරීමේ සහ අසාධාරණ ලෙස පෙනෙන ඒවා ඉක්මනින් අවසන් කිරීමේ ක්‍රම නිර්දේශ කිරීම සඳහා බලය සහිත කුඩා, අර්ධ වශයෙන් ස්ථාවර කාර්ය සාධක බලකායක් පිහිටුවීමට අපි නිර්දේශ කරමු.

6. බදු පරිපාලන ප්‍රතිසංස්කරණයේ දිගුකාලීන උපාය මාර්ගයක කොටසක් ලෙස දිස්වන්නේ නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යය පහසු කළ හැකිය. 1968 බදු කොමිෂන් සභා වාර්තාවේ දක්වා ඇති විශිෂ්ට උපාය මාර්ගයෙන් එය ආරම්භ කරන ලෙස අපි නිර්දේශ කරමු. සම්පාදනය කරන ලද කාල වකවානුවට ඉදිරියෙන් තිබූ එය අදටත් දැඩි ලෙස අදාළ වේ. එහි මූලික හරය වූයේ බදු ප්‍රතිපත්ති සහ බදු ක්‍රියාත්මක කිරීමේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සහ අධ්‍යක්ෂවරුන් සහිත ආදායම් අධ්‍යක්ෂ කාර්යාංශයක් පිහිටුවීමේ යෝජනාවයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව වෙනම දෙපාර්තමේන්තු ලෙස පවතින අතර, ඒවායේ ප්‍රධාන අරමුණු වන්නේ තක්සේරු සිදුකිරීමයි. වෙනත් බොහෝ කාර්යයන් (උදා: එකතු කිරීම, විමර්ශන, මානව සම්පත්, නීතිමය) විශේෂිත, පොදු දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලැබේ. මේ වන විට ලංකාව තුළ කැපී පෙනෙන අඩුපාඩුවක් වන්නේ වෙනම ක්‍රියාත්මක වන ආදායම් දෙපාර්තමේන්තු අතර සහයෝගීතාවක් නොමැතිකම වන අතර ආදායම් අධ්‍යක්ෂ කාර්යාංශය මගින් එම තත්වය වෙනස් කරනු ඇත. මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේදී, 2002-4 කාලයේ පැවති ආණ්ඩුව විසින් අර්ධ ස්වයං පාලනයක් සහිත ආදායම් අධිකාරියක් පිහිටුවීමට අදාළ යෝජනාවක් ඉදිරිපත් කළ බව සහ එය ආදායම් ආයතනවල කාර්ය මණ්ඩලය විසින් වහා එම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලද බවට අපට අවබෝධයක් තිබේ. එයට එක් හේතුවක් වූයේ එය උපදෙස් විමසීමකින් තොරව හදිසියේ ප්‍රකාශයට පත්කිරීමයි.  උපදෙස් විමසීම හොඳ දෙයකි. එහෙත්, එමගින් යෝජනාව සඳහා පුළුල් සහයෝගයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය. අප යෝජනා කරන්නේ උපායමාර්ගික අරමුණ විය යුත්තේ ආදායම් අධ්‍යක්‍ෂ ජනරාල් කාර්යාංශය නිර්මාණය කිරීම, සේවකයන්ට වැඩි වැටුප් පැකේජ සහ සේවා කොන්දේසි සහිතව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉක්මනින් එයට මාරු කිරීම  සහ දිගුකාලීනව රේගු සහ සුරාබදු දෙපාර්තමේන්තු එයට අනුබද්ධ කිරීම බවයි.

උමේෂ් මොරමුදලි, කොළඹ විශ්වවිද්‍යාලය

මික් මුවර්, International Centre for Tax and Development and IDS, Sussex.

2022 අප්‍රේල් 12